

# වසංගත හා ව්‍යසන සමඟ ඉස්ලාමය කටයුතු කරන්නේ කෙසේද ?

PDF
BOOK FOR MOBILE



بسم الله الرحمن الرحيم

අපරමිත දයාන්විත අසම සම කරුණාන්විත

# අල්ලාහ්ගේ නාමයෙන්

මාතෘකාවට යාමට රූපය
මත ක්ලික් කරන්න




වසංගත සමඟ කටයුතු කරන්නේ කෙසේද?




ඇති වන්නේ ඇයි?




වැළක්වීම සඳහා ඉඟි සහ උපදෙස්




ඕනෑම වෛරසයක් ආසාදනය වූ විට ගත යුතු



# ඉස්ලාමය

## වසංගත හා ව්‍යසන සමඟ කටයුතු කරන්නේ කෙසේද ?

විශේෂයෙන් විසිවන සියවස ආරම්භයේදී සුළි කුණාටු, භූමිකම්පා, නියඟ, රෝග සහ වෛරස් යනාදිය ඉතා පුළුල් ලෙස පැතිරී ඇති බවට දක්නට පුළුවන.

එහෙත් මෙවැනි ආපදාවන් සිදුවීමේ රහස කුමක්ද? එවැනි ඛේදවාචකයන් හා අවාසනාවන්ත තත්ත්වයන් සමඟ කටයුතු කිරීමට අපට ගත හැකි පියවර මොනවාද?



# විපත් ඇති වන්නේ ඇයි?

**විපත් ඇතිවීමේ පිටුපස හේතු තුනක් තිබෙන බව ඉස්ලාම් අපට අනාවරණය කර ඇත.**

1 **පළවෙනි හේතුව:** දෙවියන් තම සේවකයන් සඳහා ස්වර්ගයේ තත්ත්වයන් ඉහළ නංවන්නේ ඔවුනට මෙවැනි පීඩා හා දුෂ්කරතා ඇති කරමිනි.

මුස්ලිම්වරු මෙම ජීවිතය හුදෙක් පරලොව කරා යන ගමනක් ලෙස සලකති. එම ජීවිතය සදාකාලික ආශීර්වාදයක් හෝ සෝචනීය ඉරණමක් හෝ විය හැක.

ස්වර්ගයේ කෙනෙකුගේ තරාතිරම තීරණය වන්නේ ඔවුන් ජීවිතයේ කොතරම් යහපත්ද යන්න සහ දුෂ්කර අවස්ථාවල දී ඔවුන් කෙතරම් ඉවසිලිවන්තව සිට ඇත්ද යන්න මතයි. එම ඉවසිලිවන්තභාවයෙන් අල්ලාහ්ගේ කුලිය අපේක්ෂා කරන්නේ නම් එය ස්වර්ගයේ ඔහුගේ නිලයන් වැඩි වශයෙන් උසස් වීමට පාදක වේ.

නිසැකවම වඩාත්ම පරීක්ෂාවට ලක්වූ අය නූහ්, ඉබ්‍රාහීම්, මූසා, ඊසා සහ මුහම්මද් වැනි වක්තෘවරුන් වෙති. ඔවුන් සිය ජනයාට ආරාධනා කිරීමේදී ඔවුන් මුහුණ දුන් දුක් වේදනාවල බරපතලකම අල්කුර්ආනය විසින් අපට විස්තර කරන ලදී. ඔවුන් කොතරම් තාඩන පීඩන වලට මුහුණ දුන්නද, ඉවසීම හා කුලිය අපේක්ෂා කිරීම යනාදිය තුළ ඔවුන් මානව සමාජයට අදටත් පරමාදර්ශයකි.

නබිතුමාගේ ධර්ම දූත මෙහෙයුමේ පළමු මොහොතේ සිටම, සිය ජනතාව එතුමාටත් එතුමාගේ සගයන් අතර සිටි කිහිප දෙනෙකුටත් එරෙහිව වසර 10 කට වැඩි කාලයක් පුරාම යුද්ධ කරමින් ඔවුනට විවිධාකාර හිරිහැර හා හානි සිදු කළහ. ඒ හේතුවෙන් සිය ජනතාව එතුමාව මරා දැමීමට සොයමින් සිටි අවස්ථාවක තම නිජබිම වන මක්කම අත්හැර පලා යෑමට එතුමාට සිදු වුණි. එවැනි අවස්ථාවක පවා නබිතුමාණන් අපට මෙසේ ඉගැන්වූහ: කවරෙකුට අල්ලාහ් යහපත අපේක්ෂා කරන්නේද: නොයෙකුත් බාධාවලින් අල්ලාහ් ඔහුව පරීක්ෂාවට ලක් කරනු ඇත.(බුහාරි: 548)

එහෙයින්, දෙවියන් මුළු විශ්වයම මැවූ බවත් එහි ඇති කුඩා හා විශාල සියල්ලම පාලනය කරන බවත් මුස්ලිම්වරයා යහමින් තේරුම්ගෙන ඇත.

ලෞකික ජීවිතයේ අනතුරු සිදුවන්නේ අහඹු ලෙස නොව, දෙවිඳුන් දන්නා අප නොදන්නා සියුම් හේතුවක් සඳහා වූ ඔහුගේ අභිමතය අනුවයි.

එහෙයින්, මුස්ලිම්වරයකු පීඩාකාරී තත්ත්වයන්හිදී දෙවිඳුන්ගේ අභිමතය ඉදිරියේ ඉවසිලිවන්තව සිට එය පිළිගත යුතුය. එම ඉවසීම සහ පිළිගැනීම මඟින්, පුද්ගලයකුට සිදුවීම් සමඟ නිසි ලෙස කටයුතු කිරීමටත් ආපදාවේදී සුදුසු පියවර ගෙන ඉදිරියට යාමටත් හැකි වනු ඇත.



තවද විශ්වාසවන්තයකු, තමන් ඉවසිලිවන්තව හා කුලිය අපේක්ෂා කරමින් සිටින්නේ නම් තමාට විශාල කුලියක් ලැබෙන බව හා එය සර්වබලධාරී දෙවියන් තමන් සඳහා කළ යහපත් පෙර නියමයක් බව තේරුම් ගනු ඇත.


එමෙන්ම නබිතුමාණන් මෙසේ සඳහන් කර ඇතː උදර රෝගයකින් මිය යන තැනැත්තා ප්‍රාණ පරිත්‍යාගිකයෙකි. වසංගතයෙන් මිය යන තැනැත්තා ප්‍රාණ පරිත්‍යාගිකයෙකි. (බුහාරී 629) **උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයිː** තවද බියෙන් හෝ සාගින්නෙන් හෝ වස්තුව, ජීවිත හා බවභෝග අඩු කරමින් හෝ යම් දෙයකින් අපි නුඹලා ව පිරික්සුමට ලක් කරන්නෙමු. නබිවරය, නුඹ ඉවසිලිවන්තයිනට ශුභාරංචි දන්වනු. ඔවුහු කවරහු ද යත් යම් අභාග්‍යයක් තමන්ට ඇති වූ විටෙක සැබැවින්ම අප අල්ලාහ් සතුය, සැබැවින්ම අපි ඔහු වෙතම නැවත යොමුවන්නන් වෙමු යැයි පවසති. තම පරමාධිපතිගෙන් වූ ආශිර්වාදයන් ද කරුණාව ද තමන් වෙත ඇත්තෝ මොවුන්ය. මොවුන්මය යහමඟ ලැබූවන් වන්නෝ. (අල්බකරාː155-157)



**2 දෙවෙනි හේතුව:** දෙවිඳුන් විශ්වාසවන්තයින්ව පාපවලින් පවිත්‍ර කරනු ඇත.

සෑම පුද්ගලයෙකුම පාපයන් හා වැරදි සිදු කරන ස්වභාවයකින් පෙළෙන නමුත්, යමෙකු පාපයක් සිදු කළ ද නොකළ ද සෑම විටම සමාව අයැදීම සඳහා ඒකීය දෙවියන් වෙත නැඹුරු විය යුතු බව ඉස්ලාමය අපට දන්වා සිටියි.

මේ ජීවිතයේ මුස්ලිම්වරයකු වන ඔහුගේ හෝ ඇයගේ වැරදි ක්‍රියාවන් පවිත්‍ර කරන සාධකයක් බවට මෙම දුෂ්කරතා පත් කිරීම ද දෙවිඳුන් තම විශ්වාසවන්ත සේවකයන් කෙරෙහි දක්වන දයාව අතුරින් එකකි. මෙම පවිත්‍ර කිරීමේ ක්‍රියාවලිය සිදු වන්නේ ජීවිතයේ සියලු ආකාරයේ දුෂ්කරතා මගිනි.



මේ හේතුවෙන් මතුලොවෙහිදී දෙවිඳුන් මුණගැසෙන විට පවු කමා කළ පාරිශුද්ධ ආත්මයකින් යුත් ජීවියෙකු ලෙස මුණ ගැසීමේ භාග්‍ය ලැබේ. මුස්ලිම්වරයෙකුට කරදරයක්, රෝගයක්, ශෝකයක්, දුකක්, වේදනාවක් හෝ විපතක් ඇති වූයේ නම් එය උල්කටුවක් ඇනුනද දෙවිඳුන් ඒ සඳහා ඔහුගේ සමහර පාපයන් කමා කරනු ඇත යනුවෙන් නබිතුමාණන් ප්‍රකාශ කර ඇත. (බුහාරීඃ 545) තවද සෑම වැරදි ක්‍රියාවකින්ම පවිත්‍ර වූවන් ලෙස සර්වබලධාරී අල්ලාහ්ව මුණගැසෙන තුරු විශ්වාසවන්ත පුරුෂයින්ට හා කාන්තාවන්ට ඔවුන්ගේ ශරීරවල, ඔවුන්ගේ පවුල්වල සහ දේපළවල දුෂ්කරතා දිගටම පවතී යනුවෙන් නබිතුමාණන් ප්‍රකාශ කර ඇත.(තිර්මිදි 494)





**3 තෙවන හේතුව:** පීඩාවන් යනු මිනිසුන් විසින් නැවත නැවතත් කරන ලද පාපයන්හි ප්‍රතිඵලයකි. විශේෂයෙන් සර්වබලධාරී දෙවියන් කෝපයට පත් කරවන ප්‍රධාන පාප යැයි කිව හැක. **උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කර ඇත:** අල්ලාහ්ගේ ප්‍රතිඥාව පැමිණෙන තෙක් ප්‍රතික්ෂේප කළවුන් ඔවුන් සිදු කළ දෑ හේතුවෙන් ඔවුනට අර්බුදයක් ඇති වීම හෝ ඔවුන්ගේ නගරයට සමීපයෙන් එය (අර්බුද ය) සිදු වීම අඛණ්ඩ ව පවතිනු ඇත. නියත වශයෙන්ම අල්ලාහ් ප්‍රතිඥා ව කඩ නොකරයි. (අර්රඃද් 31) **තවද මෙසේ ප්‍රකාශ කර ඇත:** මිනිසාගේ අත් උපයාගත් දෑ හේතුවෙන් ඔවුන් සිදු කළ දෑහි ඇතැමෙක් ඔවුන් විඳවනු පිණිස ගොඩබිමෙහි හා මුහුදෙහි ව්‍යසනයන් මතු විය. ඔවුන් නැවත හැරී ආ හැකි වනු පිණිසය. (අර්රූම්: 41)

එබැවින්, තාඩනපීඩන මානව සමාජයේ පාපයන් සහ අකුසල් සඳහා සර්වබලධාරී

දෙවියන්ගෙන් පැහැදිලි දඬුවමක් විය හැක. ඒ සමඟම පසුතැවිලි වීමෙන් දෙවියන් වෙත යොමුවීම සඳහා සහ සර්වබලධාරී උන් වහන්සේ කෝපයට පත් කරන දේ සිදු කිරීම නැවැත්වීම සඳහා කෙනෙකුට එවැනි තාඩනපීඩන එක් මතක් කිරීමකි. තවද කරදර කාලවලදී දෙවියන් ඉදිරියෙහි තම සම්පූර්ණ දුර්වලතාවය මිනිසුන්ට දැනෙන අතර ඔවුනට දෙවියන් වෙත වූ අවශ්‍යතාව ද දැනෙනු ඇත.

එමෙන් ම දෙවියන් අවිශ්වාස කරන හෝ පසුතැවිලි නොවී විශාල පාපවල යෙදෙන අයට පරලොවදී වඩා විශාල හා දැඩි දඬුවම් හිමි වන බව මෙම පරීක්ෂාවන් හරහා මතක් කර දෙනු ලැබේ. ඊට පටහැනිව, දෙවියන් පිළිබඳ විශ්වාස කිරීම සහ නබිවරුන් විසින් ගෙන එන ලද දේ අනුගමනය කිරීම වනාහි මිනිසාට සහ පොළොවට බලපාන යහපත්කම හා ආශිර්වාදය පැතිරවීමට හේතුවක් වේ යන්න ද ඒ හරහා මතක් කර දෙනු ලැබේ. **අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි**: නියත වශයෙන්ම එම ප්‍රදේශ වැසියන් විශ්වාස කොට බිය බැතියෙන් යුතු ව කටයුතු කර තිබුණේ නම් සැබැවින්ම අහසින් හා මහපොළොවෙන් අපි ඔවුන් වෙත භාග්‍යයන් විවෘත කර දෙන්නට තිබුණි. නමුත් ඔවුහු බොරු කළෝය. එවිට අපි ඔවුන් උපයමින් සිටි දෑ හේතුවෙන් ඔවුන් ව ග්‍රහණය කළෙමු. (අල්අඃරාෆ් 96)





# වෛරස පැතිරීම

## වැළක්වීම සඳහා ඉඟි සහ උපදෙස්

මුළු ලොවම මවිතයට පත් කළ කොවිඩ් 19 වසංගතය සඳහා රටවල් විසින් ගනු ලැබූ, පිළිපැදීමට හා ක්‍රියාත්මක කරන ලෙස පුද්ගලයන්ගෙන් ඉල්ලා සිටි, අනතුරු ඇඟවීම් සහ පූර්වාරක්ෂක පියවරයන් ගත් කළ, ඉස්ලාමය මීට වසර 1,400 කට පෙර ම වසංගත සමඟ කටයුතු කිරීම හා සම්බන්ධ පැහැදිලි උපදෙස් හා ඉගැන්වීම් ලබා දී ඇති බව සඳහන් කිරීම අගනේය. රෝග, වසංගත හා වෛරස් පැතිරීම වැළැක්වීමට එය නිසැකවම උපකාරී වන බව පසුකාලීනව වෛද්‍ය විද්‍යාව මඟින් සනාථ කරන ලදී. ඒ උපදෙස් අතුරින්:



## 1 අත් සේදීම:

ඉස්ලාමය විසින් අත් සේදීම තරයේ නිර්දේශ කරනු ලැබේ. මුහම්මද් නබි තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ: ඔබ අවදි වූ පසු අත් සෝදන්න. මන්ද ඔබ නිදා සිටියදී ඔබේ දෑත් ස්පර්ෂ කළේ කොතැනදැයි ඔබ නොදනී. (මුස්ලිම් 541)

අවදි වූ පසු අත් සේදීමට අමතරව මුස්ලිම්වරු දිනපතා පස්වේල් සලාතය සිදු කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවක් වන වුළු නොහොත් ශරීරයේ විවිධ කොටස් පිරිසිදු කිරීමේ ක්‍රියාවලියේ දී දෙඅත් සෝදා ගනිති. දෙඅත්ල තුන් වරක් බැගින් සේදීම මඟින් එය ආරම්භ වේ. තවද නබිතුමා අපට මෙසේ අණ කර ඇත. අත් හා පාද සේදීමේදී

ඇඟිලි සන්ධි හා පුරුක් හොඳින් සෝදා ගැනීමට වග බලා ගන්න.(මුස්ලිම්: 502) විෂබීජහරණය කිරීමට මෙම ක්‍රමය ඉතා අත්‍යවශ්‍ය බව නූතන වෛද්‍ය විද්‍යාව මඟින් ද නිර්දේශ කරනු ලැබේ.





## 2 පිරිසිදුකම:

(මුස්ලිම් නමැති හදීස් ග්‍රන්ථයේ 432 වන වදන වන) පිරිසිදුකම විශ්වාසයේ අඩකි යන නබිතුමාගේ කියමනෙන් පිරිසිදුකමෙහි වැදගත්කම පිළිඹිබු වේ.

පිරිසිදුකම කොතරම් වැදගත් ද යත්, මුස්ලිම්වරයකු පිරිසිදු තත්වයකට පත්වන තෙක් බොහෝ නමස්කාර ක්‍රියාවන් ඔහුට සිදු කළ නොහැක. අත්ල, මුඛය, නාසය, මුහුණ, දෙඅත්, හිස, කන් සහ පාද ජලයෙන් සේදීම හෙවත් වුළු සිදු කරන තුරු මුස්ලිම්වරයෙකුට සලාතය කිරීමට හෝ ඇතැම් විද්වතුන්ගේ මතයට අනුව අල්කුර්ආනය ස්පර්ෂ කිරීමට හෝ නොහැකිය. ඒ හා සමානව ලිංගික සංසර්ගයෙන් පසු මුස්ලිම්වරයෙකු යම් වන්දනාමානයක් කිරීමට පෙර ස්නානය කළ යුතුයි. සතිපතා සිකුරාදා යාච්ඥාවට සහභාගී වීමට පෙර ස්නානය කිරීම ද නිර්දේශ කෙරේ.

තව දුරටත් ඉදිරියට යමින් නබිතුමාගේ සුප්‍රසිද්ධ කියමනක මෙසේ වාර්තා වේ. යමෙකු තම යහපැවැත්ම සඳහා ක්‍රියාත්මක කළ යුතු පිරිසිදු කිරීමේ ක්‍රියාවලීන් දහයක් ගැන එම කියමන අපට උගන්වයි. නබිතුමාණන් පැවසූ බව ආඉෂාතුමිය මෙසේ වාර්තා කරයි: කරුණු දහයක් ස්වභාවික ධර්මතාවන් වේ. ඒවා නම්: උඩු රැවුල කැපීම, යටි රැවුල වැවීම, දත් මැදීම, නාසයට ජලය දමා පිරිසිදු කිරීම, නියපොතු කැපීම, ඇඟිලි පුරුක හා සන්ධි සේදීම, කිහිලි රෝම ඉවත් කිරීම, මලමුත්‍රා පහ කිරීමෙන් පසු එම ස්ථාන පිරිසිදු කිරීම වේ. (මුස්ලිම් 502)

තවද, දත් පිරිසිදු කිරීම සඳහා භාවිතා කරන ගස් අත්තක් වන (මිස්වාක් නොහොත් දැහැටි කූර) භාවිතා කිරීම වර්තමාන බුරුසුවක් හා දන්තාලේපයකට සමාන වේ.

ඉහත සඳහන් නබිතුමා කියා දුන් ක්‍රමවේද නිසි අයුරින් ක්‍රියාත්මක කිරීම මඟින් කෙනෙකුට පිරිසිදුව සිටීමට හැකි වන අතර එම නිසා වෛරස් වැනි රෝගාබාධවලට ගොදුරු වීමේ අවදානම අඩු වේ.





## 3 ආහාරපාන ගැනීමේ මාර්ගෝපදේශ

නබිතුමාණන් යමක් පානය කිරීමේ දී ඒ බඳුන තුළ හුස්ම ගැනීම තහනම් කළේය. ඒ පිළිබඳ නබි වදනෙහි මෙසේ සඳහන් වේ: ඔබෙන් කෙනෙකු යමක් පානය කිරීමේදී ඒ බඳුන තුළ හුස්ම නොගන්න. (බුහාරි 5630) සහ (සමෙන් සාදන ලද) ජල බඳුනෙහි මුඛය තබා ජලය පානය කිරීම තහනම් කළේය. (බුහාරි 5628)

මෙම තහනම් නියෝග රෝග සම්ප්‍රේෂණය වැළැක්වීමට උපකාරී වන විශ්වීය සනීපාරක්ෂක ක්‍රියා දෙකකි. එමෙන්ම නින්දට යන විට ආහාර පාන සහ භාජන වසා තබන ලෙස මුස්ලිම් නමැති හදීස් ග්‍රන්ථයේ 5624 වැනි හදීසයේ

සඳහන් වේ. මෙයද ඉස්ලාමය විසින් නිර්දේශ කරනු ලැබූවකි.

එමෙන් ම අධික ලෙස ආහාර ගැනීමෙන් වැළකී සිටින ලෙසත් මිනිසෙකු ආහාරපාන ගත යුත්තේ මධ්‍යස්තව බවත් ඉස්ලාමය අවවාද කර සිටී. අධික ලෙස ආහාර ගැනීම මිනිස් සෞඛ්‍යයට බොහෝ අහිතකර ප්‍රතිවිපාක ඇති කරන බවට සැකයක් නැත.

## 4 ඇඳුම්පැළඳුම් පිරිසිදුව තබා ගැනීම.

නබිතුමාණන් තම දෑතින්ම ඇඳුම් පිරිසිදු කිරීමට පුරුදුව සිටි අතර එය නිරතුරුව පිරිසිදුව තබා ගැනීමට ද වග බලා ගනු ඇත. සර්වබලධාරී දෙවියන් ඇඳුම් පිරිසිදු ව තබා ගැනීමට උනන්දු වන ලෙස එතුමාට අල්කුර්ආනයේ මෙසේ ඇරයුම් කරයි: (අහෝ නබිවරය! ඔබේ ඇඳුම් පිරිසිදු කරගනු මැනව) (අල්මුද්දස්සිර් 40) මුස්ලිම්වරයෙකු තම වස්ත්‍රයේ පිරිසිදුකම පිළිබඳ සෑමවිට ම අවධානයෙන් සිටිය යුතු බව ඉස්ලාමය විසින් නිර්දේශ කරනු ලැබේ.





## 5 කිවිසුම් යන විට මුහුණ වසා ගැනීම.

නබිතුමාණන් කිවිසුම් යන විට එහි ශබ්දය අඩු කිරීම සඳහා සිය අතින් හෝ වස්ත්‍රයකින් තම මුඛය ආවරණය කරනු ඇත. (අබූ දාවුද්: 5011) මෙය අන් අය වෙත විෂබීජ පැතිරීම වැළැක්වීම සඳහා වසංගත අවස්ථා වලදී දැඩි ලෙස නිර්දේශ කරනු ලබන උපදෙසකි.



## 6 සමාජ දුරස්ථභාවය:

වසංගත රෝග පැතිරීමේ කාලවලදී සමාජ දුරස්ථභාවය පිළිබඳ ලෝකයේ බොහෝ රටවල ආණ්ඩු සහ ගෝලීය සෞඛ්‍ය සංවිධාන විසින් යෝජනා කරන ලද සහ ක්‍රියාවට නංවන ලද ක්‍රියාමාර්ග ශතවර්ෂ දහහතරකට පෙර නබි තුමාණන් විසින් ප්‍රකාශයට පත් කර ඇත යන්න කැපී පෙනෙන කරුණකි. **නබිතුමා මෙසේ ප්‍රකාශ කළේය:** රටක වසංගතයක් පැතිර යන බව ඔබ දැන ගත්තේ නම් එරට තුළට ඇතුළු නොවන්න. තවද ඔබ සිටින ස්ථානයක වසංගතය ඇති වුවහොත් එම ස්ථානයෙන් ඉවත් නොවන්න.(බුහාරි 624)

සහ වසංගතය යම් රටක ව්‍යාප්ත වී ඇති බව ඔබට ආරංචි වූයේ නම් ඒ වෙත නොයන්න. ඔබ සිටින රටක එය ව්‍යාප්ත වී ගියහොත් එම රටින් ගැලවී පලා නොයන්න. (බුහාරි 626)



# පියවර

## ඕනෑම වෛරසයක් ආසාදනය වූ වීට ගත යුතු

ඉහත කී කරුණු හා සමානව ඕනෑම රෝග යක් හෝ වෛරසයක් සමඟ සටන් කිරීමට උපකාරී වන පිළියම් කිහිපයක් ඉස්ලාමය අපට උගන්වයි. ඒවා අතුරින්:

## 1. වෛද්‍ය ප්‍රතිකාරඃ

නබිතුමාණන් විසින් තම අනුගාමිකයින් හට ඔවුන්ගේ රෝගාබාධවලට ප්‍රතිකාර කරන ලෙස දිරිගන්වන ලදී. නිදසුනක් ලෙස රෝගියෙකුට උණ වැළඳී තිබුණේ නම් ජලය භාවිතා කරන ලෙස එතුමා නිර්දේශ කර ඇත. නබි වදනක මෙසේ සඳහන් වේ. අල්ලාහ්ගේ දූතයාණන් යම් අයෙකුට උණ වැළඳී තිබුණේ නම් (එයින් ඇති වන උෂ්ණත්වය අවම කිරීම පිණිස) ජලයෙන් සිසිල් කරන ලෙස අණ කළේය. (බුහාරි 620)



## 2. වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සහ සුභවාදී හැඟීම.

සමහර රෝග සඳහා ප්‍රතිකාර නොමැතිකම නිසා ගෝලීය සෞඛ්‍ය පද්ධති සිත් තැවුලට පත්වී තිබෙන මොහොතක, ඉස්ලාමය සෑම රෝගයක් සඳහාම සුවයක් ඇති බවට සුභවාදී හැඟීමක් සෑම මුස්ලිම්වරයකු තුළම ඇති කර තිබේ. සර්වබලධාරී දෙවියන් මිනිසුන් අතුරින් තමන් අභිමත කළ අයෙකුට ප්‍රතිකාරයක් සොයා ගැනීම සඳහා කෙසේ හෝ මඟ පෙන්වනු ඇත. **නබි තුමාණෝ මෙසේ පවසති:** අල්ලාහ් යම් රෝගයක් පහළ කළේ නම් එයට ප්‍රතිකාරයක් පහළ කරන්නේමය. (බුහාරි 582)





මාතෘකා වෙත

තවද නබිතුමාණෝ මෙසේ පවසති: අල්ලාහ් විසින් අසනීපය මෙන්ම ඖෂධය ද පහළ කරනු ලැබේ. සෑම අසනීපයක් සඳහාම ඖෂධයක් ද ඇත. එහෙයින් ඔබලා ප්‍රතිකාර කරන්න. එනමුත් (හරාම්) තහනම් වූ දැයින් ප්‍රතිකාර නොකරන්න. (අබූ දාවූද් : 3865)

තවත් වාර්තාවක ගම්බද අරාබිවරු කිහිප දෙනෙකුට නබි තුමාණෝ මෙසේ ප්‍රකාශ කළහ: අහෝ අල්ලාහ්ගේ දාසයිනි! වෛද්‍ය ප්‍රතිකාර ලබා ගන්න. මක්නිසාදයත්, අල්ලාහ් යම් රෝග යක් ඇති කළේ නම් ඒ සඳහා පිළියමක් නියම කරන්නේමය. නමුත් වයසට යාම සඳහා පමණක් බෙහෙත් නැත. (අබූ දාවූද් : 3846)



## 3. පුණ්‍යාධාර ලබා දීම

ඉස්ලාමය දුප්පතුන්ට පුණ්‍යාධාර ලබා දෙන ලෙස බොහෝ අවස්ථාවල ඉල්ලා සිටින අතර මෙය දෙවියන් වෙත සමීප වීම සඳහා වූ සත් ක්‍රියාවක් ලෙස ද පත් කොට ඇත. මෙම ඉල්ලීම නන්අයුරින් සිදු වේ. ඇතැම් විට, මුස්ලිම්වරයකු සිය ආගමේ කුළුණක් වශයෙන් එය ලබා දේ. ඇතැම් විට, ඔහු කරපු පාපයක් සඳහා වන්දියක් වශයෙන් එය ලබා දේ. තවත් විටෙක, කුලිය බලාපොරොත්තු වී එසේ ලබා දෙන අතර රෝගයක් වැළඳුණේ නම් එයින් සුවය ලබා ගැනීමේ අරමුණින් ද එය ලබා දේ.



## 4. අල්ලාහ් වෙත භාර කිරීම

අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට සමගාමීව යමෙකු දෙවියන් වෙත ද විශ්වාස තැබිය යුතුයි. ලොකු හෝ කුඩා සෑම දෙයකම මැවුම්කරුවාණන් දෙවියන් බව දේව විශ්වාසී මිනිසා නිසැකවම දනී. ඒ දෙවියන් සෑම දෙයක්ම යම් හේතුවක් මත සිදු කරන අතර සියල්ල ඔහුගේ භාරයේ ඇති භාරකරු ඔහු බවද දනී.

දෙවියන් කෙරෙහි විශ්වාසය තැබුවේ නම්, දෙවියන් ඔහුට ප්‍රමාණවත් ය, දෙවියන් ඔහුගේ භාරකරුය යනුවෙන් අල්කුර්ආනය මඟින් නිරතුරුව දේව විශ්වාසීන් තෘප්තියට පත් කරනු ලබන ආකාරය අප දකින්නේ මේ නිසාවෙනි. ශුද්ධ වූ අල්කුර්ආනය මෙසේ ප්‍රකාශ කරයි: තවද කවරෙකු අල්ලාහ් වෙත භාර කරන්නේ ද එවිට අල්ලාහ් ඔහුට ප්‍රමාණවත්ය. නියත වශයෙන්ම අල්ලාහ් ඔහුගේ කාර්යය සිදු කරන්නාය. සෑම දෙයකටම නියමිත ප්‍රමාණයක් අල්ලාහ් ඇති කළේය. (අත්තලාක් 3)

අල්ලාහ්ගේ දූත ඉබ්රාහීම් තුමාණන් අපට සැමදා ආදර්ශයකි. එතුමා සිය පවුල බලා මෙසේ කීවේය. මා හට රෝගයක් ඇති වුයේ නම් අල්ලාහ් වන ඔහුමය මා හට සුවය ලබා දෙන්නේ. (ෂුඅරා: 80) එතුමාගේ කියමනෙහි ගැබ් වී ඇත්තේ දෙවියන් කෙරෙහි වූ සම්පූර්ණ භාර වීමකි.





## 5. සන්සුන්භාවය හා ධනාත්මක චින්තනය

වර්තමාන රෝගී තත්වය පහව යනු ඇතැයි විශ්වාස කර සන්සුන්ව හා ධනාත්මකව සිටීම, ප්‍රතිශක්තිකරණ පද්ධතියට නිසි පරිදි කටයුතු කිරීමට උපකාර වන ප්‍රතිකාරයකි. ඊට වෙනස්ව, ඍණාත්මක බව සහ අශුභවාදී හැඟීම් පුද්ගලයෙකුගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය දුර්වල කරයි. නබිතුමාණන් මෙසේ පැවසීය: ශුභවාදී හැඟීම් වලට මා කැමත්තක් දක්වමි. එවිට එතුමාගේ සගයෙකු ශුභවාදී හැඟීම් යනු කුමක්ද යනුවෙන් විමසන ලදී. යහපත් වචන වේ යනුවෙන් නබිතුමාණන් පැවසූහ. (මුස්ලිම් 5520)

නිදසුනක් ලෙස - අල්ලාහ් අභිමත කළේ නම් සතිය අවසාන වන විට සුවය ලබා ඉතා ඉක්මනින් වැඩට යන්නට හැකි වේවි යැයි මා බලාපොරොත්තු වෙමි යන අයුරින් රෝගියා ධනාත්මකව සිතා තමා විසින් ම ප්‍රබෝධමත් විය යුතුය.



මාතෘකා
වෙත



## 6. රහස් අවිය:

රහස් අවිය යන්නෙන් අදහස් වන්නේ අයැදීමයි. මෙය ඕනෑම රෝගයකට එරෙහිව සටන් කිරීම සඳහා වූ ඉතා ඵලදායී ආයුධයකි. අපට ඇති වන සෑම කරදරයකදීම අල්ලාහ් තමා වෙත නැඹුරු වන ලෙසත් තමාගෙන් අයැදින ලෙසත් අපට අණ කර ඇත. ඒ අයැදීමට ප්‍රතිචාර දක්වන බවට මෙසේ ඔහු පොරොන්දු වී ද ඇත. නුඹලා මා අමතනු. මම නුඹලාගේ ප්‍රාර්ථනාව පිළිගනිමි. (ගාෆිර් 60) තවද මෙසේ සඳහන් වේ:

එසේ නැතහොත් කරදරයක පැටලුණු අය ප්‍රාර්ථනා කළ විට පිළිතුරු දී එම නපුර ඉවත් කරන්නා ද විශිෂ්ඨ වන්නේ? (නම්ල් 62) යම් කරදරයක පැටලී එයින් නිදහස සොයන අයෙකුගේ ප්‍රාර්ථනාවට පිළිතුරු දෙන්නා අල්ලාහ් බව ශුද්ධ වූ අල්කුර්ආනය මෙම පාඨය මඟින් අප දැනුවත් කරයි.

ආඉෂා තුමිය මෙසේ වාර්තා කරයි: නබිතුමාණන් එතුමා වෙත රැගෙන එන ලද රෝගීන් සඳහා ආරක්ෂාව පතා අද්හිබිල් බඃස රබ්බන්නාසි, ඉෂ්ෆි අන්තෂ් ෂාෆි, ලා ෂිෆාඅ ඉල්ලා ෂිෆාඋක, ෂිෆාඅන් ලා යුගාදිරු සකමා යනුවෙන් පවසනු ඇත.

තේරුම: අහෝ අල්ලාහ්! ජනතාවගේ ස්වාමීනි, කරදරය ඉවත් කර මෙම රෝගියා සුව කරනු මැනව. ඔබ සුව කරන්නා ය. ඔබේ සුවය මිස වෙන කිසිම සුවයක් නැත. කිසිදු වේදනාවක් ඉතිරි නොවන සුව කිරීමකින් සුවය ලබා දෙනු මැනව!(බුහාරී 579)

විපතකදී, හෝ යම් කරදරයක දී දෑත් ඉහළට ඔසවා තමන්හට අනුකම්පා කරන ලෙසත් සුවය ලබා දෙන ලෙසත් ඉල්ලා අයැදීම, සැබැවින්ම අල්ලාහ් තම ගැත්තන්ගෙන් ප්‍රිය කරන ක්‍රියාවකි. නබිතුමාණන් අපට මෙසේ ප්‍රකාශ කර ඇත. කෙනෙකුගේ ආයුෂ දීර්ඝ කරනු ලබන්නේ යහක්‍රියාවෙන් මගිනි. පෙරනියමය අවලංගු කරනු ලබන්නේ අයැදීමෙනි. මිනිසා තමා විසින් සිදු කරනු ලබන යම් පාපයක් මගින් බොහෝ ආශිර්වාද ඔහුට අහිමි වී යනු ඇත. (ඉබ්නු මාජාහ්)



# අවසන් වදන් පෙළ

ලෝකය පසුකර ආ සියලු ව්‍යසන හා වසංගත මෙන් - මෙම ගෝලීය වසංගතය ද - සර්වබලධාරි දෙවියන්ගේ කැමැත්තෙන් - සීග්‍රයෙන් හෝ මන්දගාමී ව හෝ පහ වී යනු ඇත යන්න නොරහසකි. ඉන්පසු සාමාන්‍ය ජීවිතය එහි පෙර යුගයට නැවත පැමිණෙනු ඇත. ලොව පුරා රජයන් සහ වෛද්‍ය සංවිධාන මෙම උවදුර ආදර්ශයට ගනිමින් මෙවැනි වසංගත තත්ත්වයකදී අවශ්‍ය වන ඔවුන්ගේ වෛද්‍ය සහ පරිපාලන හැකියාවන් වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ඇත.

ඒ හා සමානව සෑම පුද්ගලයෙකුම මෙම වසංගතයෙන් පාඩම් රාශියක් ඉගෙන ගත හැක. සර්වබලධාරි දෙවියන්ගේ බලය පිළිබඳ සිතා බලා ඔහු වෙත යොමුවිය යුතුය. දෙවිඳුන් විෂයෙහි තමා තුළ ඇති නොසැලකිල්ලට සමාව දෙන ලෙසත් මෙවැනි වසංගතයට පෙර තිබූ නොසැලකිලිමත්භාවය වෙත හා දෙවියන්ගෙන් ඈත් ව සිටි ජීවිතය වෙත නැවත වරක් නොයා සිටිය යුතු ලෙසත් ප්‍රාර්ථනා කළ යුතුයි.

දෙවියන් ඔබ සැමට ආශීර්වාද කර, කරදරවලින් ඔබ සැම ආරක්ෂා කරත්වා!

مركز أصول
OsoulCenter
www.osoulcenter.com

ඉස්ලාමය පිළිබඳ වැඩි විස්තර සඳහා

GUIDE TO ISLAM

පොත් හා වෙනත් දෑ බාගත කිරීම සඳහා

OSOUL STORE

ඉස්ලාමය භාෂා කිහිපයකින් සාකච්ඡා කරන්න

Chat in your language

මුල් පිටුවට